# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1761/8 - 2012 ජුනි 07 වැනි බ්‍රහස්පතින්දා - 2012.06.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

බස්නාහිර පළාතේ 2012 අංක 02 දරන ඛනිජ බදු ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, බස්නාහිර පළාතේ 2012 අංක 02 දරන ඛනිජ බදු ප්‍රඥප්තිය සඳහා බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව ලද 2012.05.10 දින සිට, එම ඛනිජ බදු ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ප්‍රසන්න රණතුංග,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ,<br>
ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන,<br>
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන,<br>
පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති,<br>
මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය.

2012 ජුනි මස 01 වැනි දින,<br>
කොළඹ 07,<br>
ශ්‍රාවස්ති මන්දිරය,<br>
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**බස්නාහිර පළාතේ 2012 අංක 02 දරන ඛනිජ බදු ප්‍රඥප්තිය**

පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති මගින් නියමිත යම් සීමා කිරීම් ඇතුළත හා යම් නිදහස් කිරීම්වලට යටත්ව බස්නාහිර පළාත තුළ පිහිටි ඛනිජ අයිතිවාසිකම් වෙනුවෙන් බදු පැනවීම සහ අයකිරීම සඳහා ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2012 අංක 02 දරන ඛනිජ බදු ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට බලාත්මක වන්නේ ය. (ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.)

### *I වැනි කොටස*

*ඛනිජ බද්ද පැනවීම*

ඛනිජ බද්ද පැනවීම

2. 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රය යටතේ පළාත තුළ පිහිටි ඉඩමකින් "ඛනිජ ද්‍රව්‍ය" කැනීමේ, ඉවත්කරගෙන යාමේ අයිතිවාසිකම් වෙනුවෙන් පළාත තුළ ව්‍යාපාරයක් කරගෙන යන්නා වූ සෑම තැනැත්තෙක්ගෙන්ම මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය ඇතුළත් කාර්තුවේ සිට හා ඉන්පසු ආරම්භවන සෑම කාර්තුවක් සඳහාම (මෙහි මින්මතු ඛනිජ බද්ද යනුවෙන් සඳහන් කරනු ලබන) එකී ව්‍යාපාරයෙන් ඒ තැනැත්තාගේ පිරිවැටුම සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණයට අනුව ආගණනය කරන ලැබූ බද්දක් පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති මගින් නියමිත යම් සීමා ඇතුළත සහ නිදහස් කිරීම්වලට යටත්ව හා මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව අයකරනු ලැබිය යුතුය.

යම් තැනැත්තෙකු ඛනිජ බද්ද ගෙවිය යුත්තේ කවර අවස්ථාවකදී ද යන්න.

3. (1) මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා, "ව්‍යාපාරය" යන්නෙන්, ඛනිජ ද්‍රව්‍ය කැනීමේ, ඉවත්කරගෙනයාමේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙන් ලබාගන්නා ඛනිජ, තොග වශයෙන් හෝ/සහ සිල්ලරට විකිණීම අදහස් වේ.

(2) පළාත තුළ යම් තැනැත්තෙකු විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් එක් එක් කාර්තුව සඳහා ඛනිජ බද්ද එකී තැනැත්තාගෙන් අයකරගත යුතුය.

(3) යම් තැනැත්තෙකු විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාගෙන් ඛනිජ බද්ද අයකරනු ලැබිය යුතු විටක සහ ඒ ව්‍යාපාරයේ අයිතිය මාරුවීමක් සිදුවී ඇති විටක, (1) වන උප වගන්තියේ ඇති විධිවිධාන නොතකා එකී ව්‍යාපාරයේ නව අයිතිකරු අයිතිය වෙනස් කිරීමට පෙරාතුවම එකී ව්‍යාපාරයේ අයිතිකරුව සිටියාක්මෙන් සළකා නව අයිතිකරුගෙන් ඛනිජ බද්ද අයකර ගනු ලැබිය යුතුය.

### *II වැනි කොටස*

*නිදහස් කිරීම*

4. (1) පළාතේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය වන අවස්ථාවලදී, අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින්, යම් තැනැත්තෙකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් හෝ නිශ්චිත වශයෙන් දක්වනු ලබන යම් ව්‍යාපාරයක් හෝ ඛනිජ බද්දෙන් නිදහස් කළ හැකිය.

(2) (1) වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම නියමයක්ම, *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ දිනයේ සිට හෝ ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු අතර, එකී නියමය *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ දින සිට, මාස 3ක කාල සීමාවක් ඇතුළත හෝ ඒ කාලසීමාව ඇතුළත පළාත් සභාවේ රැස්වීමක් පවත්වනු නොලැබුවහොත්, ඒ කාල සීමාව ඉකුත් වීමෙන් පසුව පවත්වනු ලබන පළාත් සභාවේ ප්‍රථම රැස්වීමේදී හෝ ඒ නියමය අනුමත කරන ලෙසට වූ යෝජනාවක් මගින් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(3) පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් නියමයක්, ප්‍රතික්ෂේප කිරීමේ දින තෙක් ඒ නියමය, වලංගුභාවයට හානියක් නොමැතිව ප්‍රතික්ෂේප කිරීමේ දින සිට ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලදැයි සළකනු ලැබිය යුතු අතර, එකී නියමය යම් දිනයකදී ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලදැයි සැළකෙන්නේද එම දිනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතුය.

### *III වැනි කොටස*

*පිරිවැටුම*

පිරිවැටුම

5. මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා

(1) තොග හා සිල්ලර වෙළඳාමට අදාළව "පිරිවැටුම" යන්නෙන් යම් ව්‍යාපාරයක් කරගෙන යාමේදී ඇතුළත් වූ සෑම ගණුදෙනුවකින්ම ඇත්ත වශයෙන් ලැබුණද නොලැබුණද ලැබිය යුතු වන මුදල් ප්‍රමාණය :–

(අ) පහත දැක්වෙන මුදල් ප්‍රමාණය අඩුකිරීමෙන් පසුව :–

(1) ඒ මුදලේ ඇතුළත් වූ යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමෙන් ලත් මුළු මුදල ; ද

(2) කලින් වූ යම් කාර්තුවකදී ඒ ව්‍යාපාරයෙහි පිරිවැටුමෙහි ඇතුළත් කරනු ලැබ ඇත්තා වූද ඒ සම්බන්ධයෙන් වූ ඛනිජ බද්ධ ගෙවනු ලැබ ඇත්තාවූ ද යම් මුදලක් අදාළ කාර්තුව තුළදී බොල් ණයක් බවට තහවුරුවී ඇත්නම් එම මුදල ; සහ

(ආ) කලින් වූ යම් කාර්තුවකදී කපා හරින ලද්දා වූ ද, කපාහැරීමට අවසර දෙන ලද්දා වූද යම් බොල්ණයක් වෙනුවෙන් ඒ අදාළ කාර්තුව තුළදී ලැබුණු යම් මුදලක් එකතු කිරීමෙන් පසුව ඒ මුදල ;

අදහස්වේ.

*IV වැනි කොටස*

*වාර්තා*

6. (1) පළාත තුළ යම් ව්‍යාපාරයක් කරගෙන යන සෑම තැනැත්තෙකු විසින්ම, එක් එක් කාර්තුවේදී ඒ ව්‍යාපාරයේ පිරිවැටුම දැක්වෙන වාර්තාවක් ඒ එක් එක් කාර්තුව අවසාන වීමෙන් පසු, දින පහළොවක් ගතවීමට පෙර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි සෑම වාර්තාවක්ම නියමිත ආකෘතිය මගින් විය යුතු අතර ඒ ආකෘතියෙහි ඇතුළත් කළ යුතු යයි නියමිත සියලු තොරතුරු ඒ ආකෘතියෙහි ඇතුළත් කළ යුතුය. වාර්තා සහ තොරතුරු

(2) තක්සේරුකරුවකුගේ විනිශ්චය පරිදි බනිජ බද්ද අයකරනු ලැබිය හැකි යම් තැනැත්තෙකු වෙත යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නියමිත කාලය ඇතුළත අවශ්‍ය විස්තර ඇතුළත් වාර්තාවක් සපයන ලෙස විධාන කළ හැකිය.

(3) යම් තැනැත්තෙකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක පිරිවැටුම සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ලබාගැනීමේ කාර්යය සඳහා තක්සේරුකරුවෙකු විසින් ඒ තැනැත්තා වෙත යවනු

ලබන ලිඛිත දැන්වීමකින් :–

(අ) ඒ දැන්වීමේ සඳහන් කාල සීමාව ඇතුළත එහි සඳහන් යම් පොත්, ගිණුම්, වෙළඳ ලැයිස්තු, ලේඛන, වවුචර්, චෙක්පත්, ගෙවිලි තුණ්ඩු, විගණන වාර්තා, පරිගණක වාර්තා හෝ ඒ තැනැත්තා සන්තකයේ ඇති ඒ දැන්වීමේ සඳහන් වෙනත් යම් ලේඛන පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලෙස හා තක්සේරුකරු වෙත යවන ලෙස ;

(ආ) ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් පිරිවැටුම පිළිබඳ පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා ඒ දැන්වීමේ සඳහන් යම් ස්ථානයකට එහි සඳහන් යම් දිනයක හා වේලාවක ඒ තැනැත්තාට හෝ බලය ලත් නියෝජිතයෙකුට පැමිණෙන ලෙස.

නියම කරනු ලැබිය හැකිය.

*V වැනි කොටස*

*බදු ගෙවීම*

7. යම් කාර්තුවක් සම්බන්ධයෙන් වූ බණිජ බද්ද ඒ කාර්තුව අවසන් වීමෙන් පසුව එළඹෙන මාසයේ පහළොස්වන දින පසුවීමට පෙර ගෙවිය යුතුය. එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතුය. අදාළ වගකීම හටගත් අවස්ථාවේ ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තෙකු විසින් ද, ඒ තැනැත්තා විසින් හෝ යම් බද්දක් එක් තැනැත්තකුට වැඩි දෙනෙකු ගෙවිය යුතුව ඇති අවස්ථාවක, එක් තැනැත්තකු හෝ ඒ තැනැත්තන්ගෙන් එක් එක් තැනැත්තන් විසින් හෝ යම් බද්දක් හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතුව ඇති අවස්ථාවක, ප්‍රමුඛ හවුල්කරුගේ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරුවන් විසින් හෝ යම් බද්ධක් සංස්ථාගත කල සමාගමක් විසින් ගෙවිය යුතු අවස්ථාවක ඒ සමාගම විසින් හෝ එම සමාගමේ අධ්‍යක්ෂ ධූර දරන හෝ දැරූ අධ්‍යක්ෂවරු විසින් එක්ව හෝ වෙන් වෙන්ව හෝ මේ ප්‍රඥප්තිය කාර්යය සඳහා ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතුය. බදු ගෙවීම.

8. (1) යම් බනිජ බද්දක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක ගෙවීම පැහැර හරින්නකු විසින් ගෙවීම පැහැර හැර ඇති ඒ බද්දට අතිරේකව දණ්ඩනයක් වශයෙන් ; ගෙවීම පැහැර හැරීම සඳහා දණ්ඩනය.

(අ) ගෙවීම පැහැර හැර ඇති මුදලින් සියයට දහයකට සමාන මුදලක් ; සහ

(ආ) ගෙවීම පැහැර හැර ඇති යම් මුදලක් ඒ බද්ද ගෙවීම පැහැර හැරීම ඇරඹී ඇත්තේ යම් මාසයක් ඇතුළත ද ඒ මාසයට පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනට පෙර නොගෙවන ලද අවස්ථාවක, ගෙවීම පැහැරහැර ඇති කාල සීමාවේ එක් එක් මාසයේ හෝ ඉන් කොටසෙහි පහළොස්වන දිනයෙන් අවසන් වන එක් එක් කාල සීමාව වෙනුවෙන්, ගෙවීම පැහැර හරිනු ලැබ ඇති මුදලින් සියයට දෙකකට සමාන වැඩිපුර මුදලක්,

ගෙවනු ලැබිය යුතුය.

එසේ වුවද, මෙම උප වගන්තිය යටතේ දණ්ඩනය වශයෙන් ගෙවනු ලැබිය යුතු මුළු මුදල ගෙවීම පැහැර හැර ඇති බද්දෙන් සියයට පනහක් කවර අවස්ථාවකදී හෝ නොඉක්මවිය යුතු අතර ගෙවීම පැහැර හැරීම සිදුවී ඇති යම් විශේෂ කාරණා හේතුකොටගෙන ඒ මුදල අත්හැරීම හෝ අඩුකිරීම සාධාරණ සහ යුක්තිසහගත බව කොමසාරිස්වරයා සෑහීමකට පත්වන්නේ නම් එවැනි යම් මුදලක් අත්හැරීම හෝ අඩුකිරීම කළ හැකිය.

## *VI වැනි කොටස*

*මුදල් ප්‍රඥප්තියේ ඇතැම් පරිච්ඡේදවල*
*විධිවිධාන අදාළ බව*

1990 අංක 6 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ ඇතැම් විධිවිධාන අදාළ විය යුතු බව.

9. බස්නාහිර පළාතේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදයේ 10(4),(5),(6),(7),(8),(9),(10) උප වගන්තිවල විධිවිධාන ද, VII, VIII, IX, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXXII, XXXIII, XXXIV වන පරිච්ඡේදවල විධිවිධාන ද පිළිවෙලින් වාර්තා, තක්සේරු කිරීම්, තක්සේරුවල අවසානාත්මක භාවය සහ වැරදි වාර්තා සඳහා දණ්ඩනය, විශේෂ අවස්ථා, දණ්ඩන සහ වැරදි, සාමාන්‍ය කරුණු, අභියාචනා, සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා කිරීම, අභියාචනාධිකරණයට කරනු ලබන අභියාචනා, බද්ද අයකර ගැනීම, සාමාන්‍ය කරුණු, ක්‍රියාත්මක කිරීම, අර්ථ නිරූපණය, යන විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මෙම ප්‍රඥප්තිය යටතේ පිළිවෙලින් වාර්තා, තක්සේරු කිරීම්, තක්සේරුවල අවසානාත්මකභාවය සහ වැරදි වාර්තා සඳහා දණ්ඩනය, විශේෂ අවස්ථා, දණ්ඩන සහ වැරදි, සාමාන්‍ය කරුණු, අභියාචනා, සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනා කිරීම, අභියාචනාධිකරණයට කරනු ලබන අභියාචනා, බද්ද අයකර ගැනීම, සාමාන්‍ය කරුණු, ක්‍රියාත්මක කිරීම, අර්ථ නිරූපණය සම්බන්ධයෙන් ද අදාළ විය යුතුය.

## *VII වැනි කොටස*

*අර්ථ නිරූපන*

අර්ථ නිරූපනය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියේ -

"අමාත්‍යවරයා" යන්නෙන්, මුදල් විෂය භාර කරනු ලැබ ඇති පළාත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා ද;

"බලපත්‍රය" යන්නෙන් 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ද ;

"කාර්තුව" යන්නෙන් යම් වර්ෂයක ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාස වල පළමු වන දිනයෙන් ආරම්භ වන මාස 3 ක කාලය ද ;

මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට අදාළව "කාර්තුව" යන්නෙන් එම දිනය ඇතුළත් යම් කාර්තුවක එදින සිට එම කාර්තුව අවසන්වන මාසයේ අවසාන දිනය දක්වා වූ කාලය ද ;

"ඛනිජ ද්‍රව්‍ය" යන්නෙන් ඝන දියර හෝ වායු ආකාරයෙන් පෘෂ්ඨය තුළින් හෝ යටින් හාරා ගතහැකි ස්වාභාවිකව ඇතිවන ඛනිජ ද්‍රව්‍යයක්ද, එවැනි ඛනිජ ද්‍රව්‍ය අඩංගු ලෝපස් කිසිවක්ද සකස් කිරීමෙන් ලබාගන්නා ඒ ඛනිජ ද්‍රව්‍යවල යම් නිෂ්පාදනයක්ද, අදහස් වන අතර, එයට දැව බත් සහ ලවනද ඇතුළත් වන නමුත් හයිඩ්‍රො කාබන් ඇතුළත් නොවේ ;

"පතල් කැනීම" යන්නෙන් ඛනිජ ද්‍රව්‍ය කිසිවක් ඇගයීමේ සහ ලබාගැනීමේ කාර්ය සඳහා පෘෂ්ඨය තුළ, මතුපිට හෝ කරනු ලබන කැනීමක් ද ;

අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවූ අවස්ථාවක, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

(උපලේඛනය 3(1) උප වගන්තිය)

බදු අනුප්‍රමාණය සියයට 0.5.

පළාත ඇතුළත ඛනිජ ද්‍රව්‍ය සඳහා පතල්, කැනීමේ, ඉවත්කර ගෙන යාමේ අයිතිවාසිකම් වෙනුවෙන්, එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා කනින ලද ඛනිජ ද්‍රව්‍යවල දල පිරිවැටුමේ වටිනාකම මත.

06-729